මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்
Department of Manpower & Employment

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT
# 2017

**Department of Manpower & Employment,**
9th Floor, Sethsirirpaya (Second Phase),
Battaramulla.

## මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

# කාර්ය සාධන වාර්තාව
# 2017

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

9 වන මහල, සෙත්සිරිපාය II වන අදියර

බත්තරමුල්ල.

පටුන


**1. හැදින්වීම**

1.1 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

1.2 රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

1.3 උපාය මාර්ගික දිශානතිය

1.4 දෙපාර්තමේන්තුවේ ගමන් මඟ

1.5 දීර්ඝ කාලීන ඉලක්ක

1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු

1.7 දෙපාර්තමේන්තුවේ අංශ

**2. සංවිධාන ව්‍යුහය**

2.1 අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2017.12.31

2.2 මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරින්ගේ තොරතුරු සාරාංශය - 2017

**3. පාලන අංශය**

3.1 කාර්ය මණ්ඩල තොරතුරු

3.2 කාර්ය මණ්ඩලය පුහුණුව

3.3 මුල්‍ය පරිපාලන සාරාංශය - 2017

**4. රැකියා නිර්මාණ හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය**

4.1 රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

4.2 වෘත්තීය මාර්ගෝපදේශ අංශය

4.3 මහජන රැකියා මධ්‍යස්ථාන(PES)

**5. මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය**

5.1 ශ්‍රම වෙළඳපල තොරතුරු ඒකකය

5.2 ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

## 1. හැඳින්වීම

### 1.1 මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. වර්තමානයේ කම්කරු, හා වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාමහා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

### 1.2 රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

**මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යන් ඉටු කරලීමට බලාපොරොත්තු වේ.**

- ජාතික මිනිස්බල හා රැකීරක්‍ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයටඅයත් කටයුතු
- ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදුකෙරෙන වෙනත් සේවාවන්

සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු.

### 1.3 උපාය මාර්ගික දිශානතිය

**<u>දැක්ම</u>**

**ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්**

<u>මෙහෙවර</u>

**පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම**

### 1.4 දෙපාර්තමේන්තුවේ ගමන් මඟ

2010 වර්ෂයේ පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුව මඟින් මේ දක්වා වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් තුළින් ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙමින් මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා ලබා දීම සඳහා කටයුතු කර ඇත.

### 1.5 දිර්ඝ කාලීන ඉලක්ක

ගෝලීය වශයෙන් පවතින තරඟකාරීත්වයන් හා අභියෝගයන් හමුවේ එම තත්වයට ගැලපෙන පරිදි හා ඊට අනුගත පරිදි ශ්‍රම බලකායක් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වේ. ඒ අනුව ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ඇති කිරීම දැක්ම කර ගත් මෙම දෙපාර්තමේන්තුවේ දිගුකාලීන ඉලක්ක පහත පරිදි වර්ගීකරණය කල හැක.

1. ගෝලීය වශයෙන් තරඟකාරී , නිපුනතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩ නැංවීම
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක් ඇති කිරීම

### 1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුළිනි.

1. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රමබලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම.සංවර්ධනය හා පුරෝකථනය
5. අවිධිමත් අංශය සංවර්ධනය
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම
8. අවධානමට ලක් වූ කණ්ඩායම්, ආබාධිත පුද්ගලයන් හා ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම
9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියළුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම


10. දේශීය හා ගෝලීය ශ්‍රමවෙළඳ පොළ නැම්යාවන් පූරෝකථනය

මේ අයුරින් විරැකියාව අවම කිරීම හා යහපත් රැකියා ඇතිකිරීම යන සද්කාරයයන් ඉටුකර ගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## 1.7 දෙපාර්තමේන්තුවේ අංශ

- පාලන, සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් අංශය
- ගිණුම් අංශය
- මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය
  - ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය
  - ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති ඒකකය
- රැකියා නිර්මාණ,ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය
  - මහජන රැකියා සේවය
  - රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන අංශය
  - වෘත්තීය මාර්ගෝපදේශ අංශය

## 2.සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ)
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ)
ප්‍රධාන ගණකාධිකාරි
අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ
සහකාර අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී.ලං.ක්‍රි. සේ
සහකාර අධ්‍යක්ෂ (පාලන) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී.ලං.ක්‍රි. සේ
සහකාර අධ්‍යක්ෂ (ශ්‍රම වෙළඳපොළ අධ්‍යනය) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හා සංවර්ධන) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (රැකියා සේවා සම්බන්ධීකරණය) ශ්‍රී.ලං.ප.සේ
ගණකාධිකාරි ශ්‍රී.ලං.ග.සේ
පරිපාලන නිලධාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි II ශ්‍රේණිය
භාෂා පරිවර්තක I ශ්‍රේණිය
සම්බන්ධීකරණ වෘ.මා.නිලධාරි
සම්බන්ධීකරණ වෘ.මා.නිලධාරි
සම්බන්ධීකරණ වෘ.මා.නිලධාරි
මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් / සංවර්ධන නිලධාරින්
මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් / සංවර්ධන නිලධාරින්
මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් / සංවර්ධන නිලධාරින්
ශාඛා ප්‍රධාන
ශාඛා ප්‍රධාන
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
1. ග්‍රාමීය රැකියා හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන
2. අවිධිමත් අංශයේ රැකියා ප්‍රවර්ධන වැඩසටහන
3. රැකියා යෝග්‍යතා සංවර්ධන වැඩසටහන
4. රැකියා සමාජ වැඩසටහන
1. වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු පද්ධති සැකසීම හා බෙදාහැරීම
2. වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යනය හා පර්යේෂණ
3. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
1. වැඩසටහන් සැලසුම් කිරීමමෙහෙයවීම හා ඇගයීම
2. ක්ෂේත්‍ර වැඩසටහන්සම්බන්ධීකරණය
3. නව වැඩසටහන් හඳුනාගැනීම හා සැලසුම් කිරීම.
1. සාමාන්‍ය පරිපාලනය
2. කාර්ය මණ්ඩල හා ආයතන කටයුතු
3. දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු
4. ගබඩා සේවය
5. සුභසාධන කටයු
1. වාර්ෂික සැලසුම් සැකසීම හා වාර්තා සැකසීම.
2. කාර්ය මණ්ඩල සංවර්ධනය
3. ප්‍රගති ඇගයීම් කටයුතු
4. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
5. දෙපාර්තමේන්තු ප්‍රකාශන
1. ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා අධ්‍යනය
2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු එකතු කිරීම
3. විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම
1. මිනිස්බලය පුරෝකථනය කිරීම.
2. ආංශික මිනිස්බල සැලසුම් සැකසීම
3. අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය මඟින් සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතුකිරීම
4. මිනිස්බල සංවර්ධනය සඳහා ආදාළ ප්‍රතිපත්ති හා යෝජනා ක්‍රම සැකසීම හා ක්‍රියාත්මක කිරීම
1. ජාතික රැකීරක්ෂා සේවා ජාලයක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
2. රැකියා සේවා සපයන ආයතන අතර සම්බන්ධීකරණය
3. රැකියා පොළ
1. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ කටයුතු
1. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු

## 2.1 අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2017.12.31

| අනු අංකය | තනතුර | අදාළ වන සේවය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ (විශේෂ) | 1 | 1 | 0 |
| 2 | අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 1 | 0 |
| 3 | අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 1 | 0 |
| 4 | අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හා පර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 1 | 0 |
| 5 | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS I | 1 | 1 | 0 |
| 6 | අභ්‍යන්තර විගණක | SLAcS II/III | 1 | 0 | 1 |
| 7 | ගණකාධිකාරී | SLAcS II/III | 1 | 0 | 1 |
| 8 | ස.අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 0 | 2 |
| 9 | ස.අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හාපර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 1 | 1 |
| 10 | ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 1 | 1 |
| 11 | ස.අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හාපර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III | 1 | 1 | 0 |
| 12 | ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III | 1 | 1 | 0 |
| 13 | පරිපාලන නිලධාරී | රා.කළ.සේ.අධි | 1 | 0 | 1 |
| 14 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය I/II | 1 | 0 | 1 |
| 15 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී .ලං.තො.ස.තා.සේ 2පන්තිය II/III | 1 | 0 | 1 |
| 16 | සංඛ්‍යා ලේඛන නිලධාරී | ක්ෂේත්‍රගත/කාර්යාලගත II/III | 1 | 0 | 1 |
| 17 | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් | ආශ්‍රිත සේවය | 85 | 32 | 53 |
| 18 | ව්‍යාපෘති නිලධාරීන් | ආශ්‍රිත සේවය | 3 | 3 | 0 |
| 19 | මානව සම්පත් සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | 560 | 517 | 43 |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සේ I/II/II | 25 | 14 | 11 |
| 21 | රියදුරු | රියදුරු සේවය | 8 | 7 | 1 |
| 22 | කාර්යාල කාර්ය සහයක | කාර්යාල කාර්ය සහයක සේවය II/III | 7 | 6 | 1 |
| | එකතුව | | **707** | **588** | **119** |

**2.2** මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරින්ගේ තොරතුරු සාරාංශය - 2017

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | දිස්ත්‍රික්ක මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | මුළු සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් පුරප්පාඩු | දිස්ත්‍රික් මට්ටමින් පුරප්පාඩු | අතිරික්ත සංඛ්‍යාව | මුළු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| අම්පාර | 19 | 20 | 6 | 26 | 0 | 0 | 1 | 0 |
| අනුරාධපුර | 22 | 16 | 7 | 23 | 6 | 0 | 0 | 6 |
| බදුල්ල | 15 | 09 | 3 | 12 | 6 | 0 | 0 | 6 |
| මඩකලපුව | 14 | 14 | 8 | 22 | 0 | 0 | 0 | 0 |
| කොළඹ | 13 | 12 | 5 | 17 | 1 | 0 | 0 | 1 |
| ගාල්ල | 19 | 22 | 12 | 34 | 0 | 0 | 3 | 0 |
| ගම්පහ | 13 | 16 | 11 | 27 | 0 | 0 | 3 | 0 |
| හම්බන්තොට | 12 | 12 | 16 | 28 | 0 | 0 | 0 | 0 |
| යාපනය | 15 | 14 | 7 | 21 | 1 | 0 | 0 | 1 |
| මහනුවර | 20 | 20 | 14 | 34 | 1 | 0 | 0 | 1 |
| කෑගල්ල | 11 | 13 | 12 | 25 | 0 | 0 | 2 | 0 |
| කළුතර | 14 | 14 | 12 | 26 | 0 | 0 | 0 | 0 |
| කුරුණෑගල | 30 | 36 | 13 | 49 | 0 | 0 | 6 | 0 |
| මාතර | 16 | 18 | 13 | 31 | 0 | 0 | 2 | 0 |
| මාතලේ | 11 | 9 | 9 | 18 | 2 | 0 | 0 | 2 |
| මොණරාගල | 11 | 11 | 6 | 17 | 0 | 0 | 0 | 0 |
| නුවර එළිය | 5 | 4 | 1 | 5 | 1 | 0 | 0 | 1 |
| පුත්තලම | 16 | 13 | 4 | 17 | 4 | 0 | 0 | 4 |
| පොළොන්නරුව | 7 | 5 | 4 | 9 | 2 | 0 | 0 | 2 |
| රත්නපුර | 17 | 18 | 6 | 24 | 0 | 0 | 1 | 0 |
| ත්‍රිකුණාමලය | 11 | 8 | 3 | 11 | 3 | 0 | 0 | 3 |
| වවුනියාව | 4 | 4 | 2 | 6 | 0 | 1 | 0 | 1 |
| මන්නාරම | 5 | 3 | 2 | 5 | 2 | 0 | 0 | 2 |
| කිලිනොච්චි | 4 | 3 | 7 | 10 | 1 | 0 | 0 | 1 |
| මුලතිව් | 6 | 0 | 2 | 2 | 6 | 0 | 0 | 6 |
| එකතුව | **330** | **314** | **185** | **499** | **36** | **1** | **18** | **37** |

# 3. පාලන අංශය

පාලන අංශය යටතේ පහත සඳහන් ඒකකයන් ස්ථාපිත කර ඇත.

i. ආයතන අංශය
ii. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම උදෙසා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට දායක වීම තුලින් විශිෂ්ඨ කාර්ය සාධනයක් ළඟා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමණාකාරිත්වයට සහය වීම පිණිස ආයතන කටයුතු හා සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙයවීම ඇගයීම හා නංවාලීම පාලන අංශය වෙත පැවරී ඇති මූලික කර්තව්‍යයකි. ඊට අමතරව දෙපාර්තමේන්තුවේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා ප්‍රයෝජනවත් භෞතික අභිමතාර්ථයන්ට හා කාර්යයන්ට ගැළපෙන උසස් තත්ත්වයක් සහිත සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අංශ අතර මනා විධිමත් සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම, කාර්යය මණ්ඩලයේ සුභ සාධන පහසුකම් නංවාලීම හා සෙසු අංශයන් සඳහා අවශ්‍ය සහායක සේවා සැපයීම ද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

### 3.1 කාර්ය මණ්ඩල තොරතුරු

#### 3.1.1 මාණ්ඩලික නිලධාරින් අළුතින් බඳවා ගැනීම

| අනු අංකය | නම | තනතුර | සේවයට පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | නීල් බණ්ඩාර හපුහින්න මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2017.08.31 |
| 2 | ලාල් සමරසේකර මයා | අධ්‍යක්ෂ | 2017.09.20 |

**i. මාණ්ඩලික නිලධාරින් ස්ථාන මාරු වීම්**

| අනු අංකය | නම | තනතුර | සේවයට පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ඒ.සාරන්කන් මයා | අධ්‍යක්ෂ | 2017.04.05 |
| 2 | එච්.ජී.ජී.ජේ.ධර්මසේන මයා | අධ්‍යක්ෂ ජනරාල් | 2017.06.22 |

**3.2 කාර්ය මණ්ඩලය පුහුණුව**

මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා 2017 වර්ෂයේදී පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා යොදවා ඇත.

| අනුඅංකය | පාඨමාලාවේ/වැඩසටහනේ නම | පැවැත්වූ දිනය | වියදම |
|---|---|---|---|
| | දේශීය පුහුණු | | |
| 1 | National Diploma in Career Guidance -2016-2017 | 2016-2017 | 37500 |
| 3 | මනෝවිද්‍යා පුහුණුව | 2017 | 23750 |
| | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 2017.08.18 -2017.11.17 | 296272 |
| | විදේශීය පුහුණු | | |
| 6 | Women & Entrprises Development | 2016.12.05-27.01.2017 | 177300 |
| 7 | Training methodology for development Proffessionals - India | 2017.01.16-2017.02.12 | 176304 |
| 8 | Training of Traines in Entrepreneurship and skill development - India | 2017.01.23 -2017.03.17 | 176304 |
| 9 | MICRO CREDIT AND SUFFICIANCY ECONOMY DEVELOPMENT - Thailand | | 94314 |
| 10 | career Achivement programe – south korea | 2017.11.18 -2017.11.26 | 494164 |

3.3 .2017දෙසැම්බර් 31 දක්වා මූල්‍ය ප්‍රගතිය

| | ප්‍රතිපාදනය (රු.000) | වියදම (රු.000) | ඉතිරිය(රු .000) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 356,195 | **350,057** | 6,138 | **98.28%** |
| ප්‍රාග්ධන වියදම් | 37,400 | 32,190 | 5,210 | 86.07% |
| එකතුව | 393,595 | **382,247** | **11,348** | **97.12%** |

## 4. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

යෞවන රැකියා අංශය ලෙස 1997 වර්ෂයේ දී යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ආරම්භ කර ඇති මෙම අංශය 2010 වර්ෂයේදී මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී දෙපාර්තමේන්තුව යටතට පත් කර ඇත.

වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා නිර්මාණ, ප්‍රවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන විවිධ, එකිනෙක යා වූ වැඩසටහන් මාලාවක් තුලින් සමස්ථ ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය නිසි වෘත්තීන් කෙරේ යොමු කරවීම, නව රැකියා අවස්ථාවන් නිර්මාණය කිරීම මෙන්ම ජාතික ප්‍රතිපත්ති හා පුද්ගල හැකියා හා දක්ෂතාවයන්ට අනුකූල රැකියාවන් ප්‍රවර්ධනය කිරීමත් යන පුළුල් පරාසයක පැතිරුණ කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.

මෙම කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා අංශය ඒකකක දෙකකට බෙදා ඇති අතර, ඒ ඒ ඒකකය සහකාර අධ්‍යක්ෂවරයකුගේ මග පෙන්වීම යටතේ මෙම කාර්යයන්හි නිරත වේ. ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරින් මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් හා සංවර්ධන නිලධාරී මඟින් මෙම වැඩසටහන් බිම් මට්ටම කරා රැගෙන යාම සිදු වේ.

**විරැකියාවෙන් පෙළෙන හා නව්‍යලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් 2017 වසරේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වන ලදි.**

### රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු

**රැකියා නිර්මාණ**

* ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්
* අවශ්‍යතා මත පුහුණු වැඩසටහන්
* උද්‍යාන අලංකරණය
* අවධානමට ලක්වූවන් සඳහා පුහුණු වැඩසටහන්
* ස්වයං රැකියා වැඩසටහන්
* තාක්ෂණික සහය වැඩසටහන්

**රැකියා ප්‍රවර්ධන**

* රැකියා පොළ
* රැකියා සමාජ වැඩසටහන
* රැකියාගත කිරීම්
* රැකියා 100 වැඩසටහන

**වෘත්තීය මාර්ගෝපදේශන**

* විශ්ව විද්‍යාල සිසුන් සඳහා
* පාසැල් වැඩසටහන් (උසස් පෙළ/ සාමාන්‍ය පෙළ)
* ගුරුවරුන් සඳහා
* රැකියා විරහිත තරුණ පිරිස සඳහා
* දෙමව්පියන් සඳහා
* හසර සඟරාව
* අවධානමට ලක්වූවන් සඳහා
* වෘත්තීය මංපෙත්

රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින හා නව්‍යලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වනු ලබයි.

සාමාන්‍ය පෙළපාසල් සිසුන්, උසස් පෙළ පාසල් සිසුන් හා පාසල් පද්ධතියෙන් බැහැර වන සිසුන් අරඹයා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලැබේ. මෙම පාසල් කණ්ඩායම් වලට අමතරව ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින හා බාහිර උපාධි හදාරන සිසුන් සඳහා ද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් වාර්ෂිකව පවත්වා ගෙන යනු ලබයි.මේ මගින් උගත් තරුණ පිරිසගේ රැකියා වියුක්තිය අවම කිරීම අරමුණු කරයි.

තවද පාසල් ගුරුවරුන් හා දෙමාපියන් වෘත්තීය වරණය පිළිබඳ දැනුවත් කිරීම් ද සිදු කරනු ලැබේ.

රැකියා අපේක්ෂිතයන් තුළ රැකියා වෙළඳපොළට අවශ්‍ය මෘදු කුසලතා වැඩිදියුණු කිරීම සඳහා රැකියා සමාජ වැඩසටහන මඟින් දින පහක පුහුණුවක් ලබා දෙනු ලැබේ.

දෙපාර්තමේන්තුව ග්‍රාමීය ආර්ථිකය ගොඩනැංවීම තුළින් රැකියා අවස්ථා ජනිත කිරීමත් ව්‍යවසායකයින් හා ස්වයං රැකියා ලාභීන් ජනිත කිරීමටත් ක්‍රියා කරනු ලබයි. මේ මගින් පුද්ගලික අංශයේ රැකියා සඳහා තරුණ ප්‍රජාව බල ගන්වනු ලබයි.

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙන් 60% ක් පමණ අවධිමත් අංශයට අයත්ය. දෙපාර්තමේන්තුව මෙහෙය වන වැඩසටහන් වන තෙදින ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන , ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන , ව්‍යවසායකත්වඅවශ්‍යතා මත පුහුණු වැඩසටහන යන වැඩසටහන් මගින් මෙම අවධිමත් අංශය සංවර්ධනය කර එය විධිමත් කරවීමට කටයුතු කරගෙන යනු ලැබේ.

මෙයට අමතරව නිදහස් රැකියා පෙළඹවීම , උද්‍යාන අලංකරණය, රැකියා 100 වැඩසටහන , වෘත්තීය මංපෙත් , ආදී වැඩසටහන් හා හසර සඟරාව වැනි ප්‍රකාශන ද  දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

තවද අවධානමට ලක්වූ කණ්ඩායම් හා විශේෂිත වූ අවශ්‍යතාවයන් සහිත වූවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා රැකියා ගත වීම් පිළිබඳ පුහුණු වීම් පවත්වනු ලැබේ.

### 4.1 රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

2017 වසරේ ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා වූ කාලයතුළ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු .මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය | |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 0.696 | 0.755 | 24 | 45 | 1947 |
| රැකියා සමාජ වැඩසටහන | 0.859 | 0.838 | 24 | 24 | 776 |
| රැකියා 100 වැඩසටහන | 0.630 | 0.582 | 30 | 29 | 5425 |
| අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 0.480 | 0.577 | 40 | 135 | 3193 |
| තාක්ෂණික සහය වැඩසටහන | 0.540 | 0.561 | 45 | 46 | 1549 |
| සුනිසි මෙහෙවර | | | | | |
| ක්ෂුද්‍රරෝපණ පදනම් කර ගත් මල් වගා ව්‍යාපෘතිය | 1.3 | 1.2 | 4 | 4 | 97 |
| බදුල්ල දිස්ත්‍රික්කයේ ආබාධිත තැනැත්තන් සිටින පවුල් සඳහා රැකියානිර්මාණ වැඩසටහන | 0.165 | 0.165 | 7 | 7 | 70 |
| **එකතුව** | **4.67** | **4.678** | **174** | **290** | **13057** |

## 4.2 වෘත්තීය මාර්ගෝපදේශ අංශය

වෘත්තීය මාර්ගෝපදේශනය ⟷ වෘත්තීය උපදේශනය ⟷ සේවා නියුක්ති උපදේශන

වෘත්තීය මාර්ගෝපදේශනය පුද්ගලයින්ගේ වෘත්තීය ජීවිතය හා එහි සංවර්ධනය සාර්ථකව කළමනාකරණය කර ගැනීම සඳහා ඉවහල් වේ. රැකියාලාභීන් තුළ ආකල්ප වර්ධනය , උත්ප්‍රේරණය සහ අවශ්‍ය දැනුම දියුණු කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේදී වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පවත්වන ලදි. 2017 වසරේ ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා වූ කාලය තුළ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු .මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය | |
| අ.පො.ස. සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1.0 | 1.226 | 2000 | 2186 | 64525 |
| අ.පො.ස. උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 0.2 | 0.429 | 1450 | 1445 | 42453 |
| ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 0.926 | 0.910 | 312 | 402 | 13195 |
| වෘත්තීය අභියෝග ජය ගැනීම | 0.876 | 0.950 | 100 | 107 | 3557 |
| උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන ( අභ්‍යන්තර/ බාහිර ) | 0.755 | 0.795 | 20 | 20 | 742 |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 0.709 | 0.664 | 25 | 33 | 1239 |
| දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 0.910 | 0.862 | 306 | 396 | 19431 |
| වෘත්තීය මංපෙත් | 0.180 | 0.184 | 7 | 11 | 1923 |
| හසර සඟරාව මුද්‍රණය | 0.300 | 0.159 | 2 | 1 | - |
| **එකතුව** | **5.856** | **6.179** | **4222** | **4601** | **147065** |

### 4.2.1. හසර සඟරාව

හසර වෘත්තීය මාර්ගෝපදේශ හා අධ්‍යාපනික ප්‍රකාශය වසර 2000 සිට දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර මෙම විෂය පිළිබඳව සිංහල භාෂාවෙන් පළ කරනු ලබන ප්‍රථම සඟරාව ද වේ. මෙම සඟරාව පාසල්, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, නගර සභා මඟින් පාලනය වන පුස්තකාල සඳහා නොමිලේ නිකුත් කරනු ලැබේ. සඟරාව සඳහා අන්තර්ගත වන ලිපි සකස් කිරීම දෙපාර්තමේන්තුවේ එම විෂය පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත් නිලධාරීන්ගෙන් හා වෘත්තීය මාර්ගෝපදේශ විෂයේ ප්‍රවීණයන් හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුලින් සිදු වේ. දෙපාර්තමේන්තුවේ කාර්යභාරයත් සමඟ පහත විෂයන් සම්බන්ධයෙන් ලිපි පළ කිරීමේදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

I. වෘත්තීය මාර්ගෝපදේශය විෂයට අදාළ ලිපි
II. රැකියා ලෝකයේ නව ප්‍රවණතා
III. වෘත්තීය මාවත් හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර
IV. සාර්ථක වෘත්තිකයෙකු ලෙස රටේ කීර්තිනාමයක් සහිත පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා ඇසුරින් සකස් කළ ලිපි
V. පාසල් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීමට අදාළ ලිපි

### 4.3 මහජන රැකියා සේවා මධ්‍යස්ථානය

මේ අංශය රැකියා නිර්මාණ,ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය යටතේ ක්‍රියාත්මක වේ. දිවයිනේ දිස්ත්‍රික්ක 24ක මෙම මහජන රැකියා සේවා මධ්‍යස්ථාන (PES)ක්‍රියාක්මක වේ. ප්‍රධාන ජාතික මහජන රැකියා සේවා මධ්‍යස්ථානය (National PES) බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත.

රාජ්‍ය හා පුද්ගලික අංශවල හවුල් ව්‍යාපෘතියක් ලෙස අංක අමප/03/0874/130/23 EPD/464 හා 2003.10.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රැකී රක්ෂා සේවා මධ්‍යස්ථාන ජාලය (රැකියා පියස) 2003 වර්ෂයේදී ස්ථාපනය කරන ලදී. ජාතික රැකීරක්ෂා ප්‍රතිපත්තියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු සබඳතා හා රැකී රක්ෂා අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය පුළුල් පරාසයක් තුළ ළඟා විය හැකි පරිගණක පද්ධතියක් හරහා සියලු මධ්‍යස්ථාන එකිනෙකට සම්බන්ධ කරන ලදී. මුලින් විදේශ ආධාර ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වූ එය 2007.01.31 දක්වා ක්‍රියාත්මක විය. අනතුරුව කම්කරු සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශය විසින් 2007.01.24 දින ඉදිරිපත් කල අංක 2/2007 අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා රැකියා පියස ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

2010 වර්ෂයේදී එම විෂය පථය කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ පිහිට වූ මිනිස් බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවට පැවරුණු අතර, ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් රැකියා පියස ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 03/2011 හා 2011.02.15 දිනැති සංදේශයට අනුව රැකියා පියස ව්‍යුහගත කිරීමට අදාළව ඉදිරිපත් කරන ලද කරුණු සඳහා 2011.05.12 දින තීරණය මඟින් අනුමැතිය ලැබී ඇත.

6/2011 අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලැබුණු තීරණ වලට අනුව Jobs Net ඇපයෙන් සීමිත සමාගම යටතේ පැවතුනු දිස්ත්‍රික් රැකියා පියස මධ්‍යස්ථාන මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුව යටතට පවරා ගන්නා ලදී. ඉන් පසුව දෙපාර්තමේන්තුව යටතේ ඇති කරන ලද දිස්ත්‍රික් මහජන රැකියා සේවා මධ්‍යස්ථාන වෙත රැකියා පියස මධ්‍යස්ථාන සතුව තිබූ භෞතික සම්පත් ද පවරා දෙන ලදී. මෙසේ පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන ක්‍රියාත්මක තත්ත්වයේ පවත්වා ගෙන යමින්

දෙපාර්තමේන්තුවේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් මහජන රැකියා සේවාව සැපයීමට අදාළ කටයුතු ඉටු කරමින් පවතී.

දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන මගින් සිදු කරනු ලබන කාර්යයන් වන්නේ ,

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- පුරප්පාඩු සහ ආයතන ලියාපදිංචි කිරීම.
- ආයතනවල පුරප්පාඩු සොයා බැලීම සඳහා කටයුතු කිරීම.
- රැකියා අපේක්ෂිතයින්ගේ රැකියා පුරප්පාඩු පිළිබඳ ලේඛණ සකස් කිරීම.
- සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීම.
- රැකියා ගැලපීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකිරීම.
- රැකියා ගතකිරීම් හා පසුවිපරම්
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් සැපයීම.
- පුහුණුව සඳහා පහසුකම් සැපයීම.
- රැකියා තත්ත්වයන් පිළිබඳව සංඛ්‍යා ලේඛණ රැස්කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- විදේශීය රැකියා අවස්ථා සඳහා මඟපෙන්වීම.
- දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම.

රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම ක්‍රම කිහිපයකට සිදුවේ. ප්‍රාදේශීය මට්ටමේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් විසින් හා රැකියා පොළවල්, රැකියා සේවා මධ්‍යස්ථාන හරහා ලබා දෙන තොරතුරු මඟින් මෙම තොරතුරු ලබා ගැනේ.

රැකියා අපේක්ෂිතයින්ගේ අපේක්ෂාවන් පදනම් කරගෙන වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් සංවිධානය කෙරේ.

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2017 වසර සඳහා වූ ඉලක්ක | | 2017/01/01 දින සිට 2017/12/31 දක්වා ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) |
| 01 | මහජනරැකියා සේවා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීම | 6 | 2.980 | 6 | 2.987 |
| 02 | මහජන රැකියා සේවාමධ්‍යස්ථාන පවත්වාගෙන යාම | 24 | 2.000 | 24 | 1.755 |
| | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | - | - | 31,249 | - |
| | රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | 25,514 | - | 21,765 | - |
| | රැකියා ගැලපීම | - | - | 25,457 | - |
| | රැකියා ගත කිරීම | 7,600 | - | 4,322 | - |
| 03 | දිස්ත්‍රික් රැකියා පොළ පැවැත්වීම | 12 | 1.863 | 11 | 1.732 |
| 04 | රැකියා සේවා සැපයීමට ශ්‍රමවෙළඳපල තොරතුරු පද්ධතියක් ස්ථාපනය - මාර්ගගත අන්තර්ජාල බිහිදොරක් | 100% | 3.000 | 20% | 2.001 |

රැකියාගත කිරීම් 2017.01.01 සිට 2017/12/31 දක්වා ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | සෘජු රැකියා ගත කිරීම් | | ස්වයං රැකියාලාභීන්/ව්‍යවසායකයින් බිහි කිරීම |
|---|---|---|---|
| | මහජන රැකියා සේවා මධ්‍යස්ථාන මගින් | ප්‍රාදේශීය ලේකම් කාර්යාලමට්ටමින් | |
| මහනුවර | 261 | 506 | 93 |
| කෑගල්ල | 158 | 400 | - |
| කොළඹ | 368 | 85 | - |
| රත්නපුර | 190 | 439 | 177 |
| බදුල්ල | 150 | 245 | 50 |
| කුරුණෑගල | 585 | 733 | 267 |
| කළුතර | 259 | 351 | 159 |
| ගාල්ල | 160 | 299 | 83 |
| මඩකලපුව | 131 | 351 | 174 |
| ගම්පහ | 305 | 398 | 46 |
| මාතර | 291 | 413 | 80 |
| පුත්තලම | 87 | 341 | 126 |
| හම්බන්තොට | 303 | 376 | 24 |
| අනුරාධපුර | 143 | 99 | 54 |
| යාපනය | 284 | 310 | 172 |
| කිලිනොච්චි | 15 | 39 | 50 |
| ත්‍රිකුණාමලය | 54 | 24 | 57 |
| නුවරඑළිය | - | 58 | - |
| මාතලේ | 124 | 467 | 29 |
| අම්පාර | 65 | 361 | 208 |
| පොළොන්නරුව | 116 | 2 | 54 |
| මොණරාගල | 137 | 142 | - |
| වවුනියාව | 65 | 52 | 81 |
| මන්නාරම | 50 | 48 | 51 |
| මුලතිව් | 21 | - | 10 |
| එකතුව | 4322 | 6539 | 2045 |

දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය

| දිස්ත්‍රික්කය | ස්ථානය | පවත්වන ලද දිනය | රැකියා අපේක්ෂිත යන් ගණන | සහභාගි වූ ආයතන ගණන | පුහුණු ආයතන ගණන | රැකියා ගැලපීම |
|---|---|---|---|---|---|---|
| ගාල්ල | ලබුදූව | 2017/01/14 | 918 | 32 | 05 | 421 |
| බදුල්ල | හාලිඇල | 2017/02/18 | 854 | 30 | 03 | 650 |
| බදුල්ල | ඌවපරණගම | 2017/02/19 | 1251 | 28 | 02 | 820 |
| ගම්පහ | මීනුවන්ගොඩ | 2017/03/25 | 674 | 38 | 07 | 1504 |
| ත්‍රිකුණාමලය | මවීර් ක්‍රීඩාංගනය | 2017/03/30 | 710 | 38 | 05 | 700 |
| නුවරඑළිය | නගර ශාලාව | 2017/07/01 | 559 | 45 | 03 | 391 |
| මොණරාගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017/08/12 | 820 | 30 | 03 | 353 |
| මාතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2017/08/19 | 768 | 25 | 07 | 850 |
| හම්බන්තොට | තංගල්ල | 2017/09/02 | 920 | 26 | 07 | 685 |
| පුත්තලම | හලාවත | 2017/09/16 | 729 | 38 | 04 | 739 |
| කළුතර | පානදුර බාලිකා විද්‍යාලය | 2017/10/21 | 510 | 42 | 7 | 758 |
| එකතුව | | | 8713 | 372 | 53 | 7871 |

## 5. මිනිස්බල සැලසුම් හා සංවර්ධන හා පර්යේෂණ අංශය

ශ්‍රම වෙළඳපල තොරතුරු විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන්, පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයන් සඳහා ද අවශ්‍ය වේ.

ශ්‍රම වෙළඳපළ තොරතුරු රැස්කිරීමේදී සීඝ්‍රව වෙනස්වන කුසලතා සපිරි මානව සම්පත සඳහා ශ්‍රම වෙළඳපල ඉල්ලුම මනාව අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ශ්‍රම වෙළඳපල තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම කරනු ලබයි.

එමෙන්ම ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපල පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම, ශ්‍රම ඉල්ලුම හා සැපයුමපිළිබඳ අධ්‍යයන සිදු කිරීමහා එම තොරතුරු බෙදා හැරීම ශ්‍රම වෙළඳපළ ඒකකයෙන් සිදුකරයි. ශ්‍රම වෙළඳපොළ තොරතුරු සඟරාව හා පාසල් පාදක දත්ත අත්පොත මේ මගින් ප්‍රකාශයට පත්කරනු ලබයි.

| අනු අංකය | යෝජිත වූ වැඩ සටහන් | කළ වැඩසටහන් | ප්‍රගතිය | මූල්‍ය සාරාංශය (රු:) |
|---|---|---|---|---|
| 01 | මූල්‍ය ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ | පොත් 1200 ක් මුද්‍රණය කර අවසන් කරන ලදී. | 100% | 132,808 |
| 02 | විදුලි හා ජල සැපයුම් ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ | අවසන් වාර්තාව සකස් කරමින් පවතී.සකස් කරවෙබ් අඩවියේ පළ කරනු ඇත. | 70% | 8,008 |
| 03 | ධීවර ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ | පොත් 1200 ක් මුද්‍රණය කර අවසන් කරන ලදී . | 100% | 293,908 |
| 04 | රාජ්‍ය සේවයේ රැකියා පැතිකඩ | පොත් 1200 ක් මුද්‍රණය කර අවසන් කරන ලදී . | 100% | 294,000 |
| 05 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු පුරෝකථනය | අවසන් කර දෙපාර්තමේන්තුවෙබ් අඩවියේ පළ කරන ලදී. | 100% | - |
| 06 | ස්වයං රැකියා විභවතාවය පිළිබඳ සමීක්ෂණය | මුල් වාර්තාව සකස් කර සමෘද්ධි දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී.අනුමත වූ පසු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. | 90% | 6,015 |
| 07 | සමාජ ආර්ථික දත්ත අත්පොත | සිංහල භාෂාවෙන් පොත් 4711ක් ද දෙමළ භාෂාවෙන් පොත් 1950 ක් ද මුද්‍රණය කර අවසන් කරන ලදී | 100% | 673,745 |

## 5.1 ශ්‍රම වෙළඳපල තොරතුරු ඒකකය

### 2017 වර්ෂයේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකයේ යෝජිත වූ වැඩ සටහන් විස්තරය

ශ්‍රී ලංකාවේ තරුණ පිරිස් අතර ප්‍රබල ගැටළුවක් බවට පත් වී ඇත්තේ විරැකියාවයි.බොහෝ තරුණ පිරිස් උසස් අධ්‍යාපනයට යොමු වී එය නිම කළ ද වාර්ෂිකව ශ්‍රම වෙළඳපොළට එකතු වන ශ්‍රම බලකාය ඉතා ඉහළ අගයක් ගනී.ශ්‍රී ලංකාවේ තරුණ පිරිස් විරැකියාවෙන් පෙළීමට මූලික හේතුව වී ඇත්තේ ශ්‍රම වෙළඳපොළ පවතින රැකියා අවස්ථාවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවයන්ය.මෙම තොරතුරු විෂමතාවයට පිළියම් වශයෙන් ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රයන්හි පවතින රැකියා අවස්ථා අධ්‍යයනය කර ඒ පිළිබඳ තොරතුරු රැකියා අපේක්ෂිතයින් වෙත ලබා දීම සඳහා පහත දැක්වෙන රැකියා පැතිකඩ සමීක්ෂණ සිදු කරන ලදී.

#### 01. මූල්‍ය ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ

මෙම සමීක්ෂණයේ මූලික අරමුණු වන්නේ මූල්‍ය ක්ෂේත්‍රයන්හි පවතින රැකියා අවස්ථාවන් මොනවාද යන්න හඳුනා ගැනීම හැකි වීම, රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම් සහ හැකියාවන් හඳුනා ගැනීමට හැකි වීම,මූල්‍ය ක්ෂේත්‍රයන්හි පවතින රැකියාවන්හි ඉහළට ගමන් කිරීමේ ක්‍රම වේදය හඳුනා ගැනීම හා මූල්‍ය ක්ෂේත්‍රයන්හි පවතින රැකියාවන්හි ප්‍රතිලාභ හඳුනා ගැනීමට (වැටුප/ අනෙකුත් ප්‍රතිලාභ/වෘත්තිය මාර්ගය) හැකි වීමයි.

බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන කිහිපයක් මූලික කර ගනිමින් අප අංශය මඟින් සකස් කරන ලද ප්‍රශ්නාවලියක් හරහා මෙම සමීක්ෂණය සිදු කරන ලදී.තෝරා ගන්නා ලද මූල්‍ය ආයතන වන්නේ

- DFCC Bank PLC
- Bank of Ceylon
- Pan Asia Bank
- Cargills Bank,
- Deutsche Bank

- Vallibel Finance PLC
- Siyapatha Finance PLC
- Mercantile Investments & Finance PLC
- People's Leasing and Finance PLC.

ඒ අනුව රැකියා 38 ක් හඳුනා ගන්නා ලදී.

## 02. විදුලි හා ජල සැපයුම් ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ

මෙම සමීක්ෂණයේ මූලික අරමුණු වන්නේ විදුලි හා ජල සැපයුම් ක්ෂේත්‍රයන්හි පවතින රැකියා අවස්ථාවන් මොනවාද යන්න හඳුනා ගැනිම හැකි වීම, රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම් සහ හැකියාවන් හඳුනා ගැනිමට හැකි වීම,විදුලි හා ජල සැපයුම් ක්ෂේත්‍රයන්හි පවතින රැකියාවන්හි ඉහළට ගමන් කිරීමේ ක්‍රම වේදය හඳුනා ගැනිම හා විදුලි හා ජල සැපයුම් ක්ෂේත්‍රයන්හි පවතින රැකියාවන්හි ප්‍රතිලාභ හඳුනා ගැනිමට(වැටුප/ අනෙකුත් ප්‍රතිලාභ/වෘත්තිය මාර්ගය) හැකි වීමයි.

විදුලිබල හා පුනර්ජනනී බලශක්ති අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ පවත්නා රජයේ සහ පෞද්ගලික ආයතන, නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති මණ්ඩල, වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍යාංශය සහ ඒ යටත් ඇති මණ්ඩල මූලික කර ගනිමින් අප අංශය මඟින් සකස් කරන ලද ප්‍රශ්නාවලියක් හරහා මෙම සමීක්ෂණය සිදු කරන ලදී.

## 03. ධීවර ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ

ශ්‍රී ලංකාවට ආශිර්වාදයක් ලෙස හැදින්වෙන ඉන්දියන් සාගරය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ඉමහත් දායකත්වක් දක්වයි. ස්වභාව ධර්මයෙන් හිමි වූ රට වටකර පවතින මහා සමුද්‍රයත්, රට අභ්‍යන්තරයේ ඇති ස්වභාවික ගංගා වැව් අමුණු ආදියත්, ආදි මුතුන්මිත්තන් විසින් දායාද කරදුන් වැව් පොකුණු ආදියත් ධීවර කර්මාන්තයෙන් රට ස්වයං පෝෂිත ආර්ථිකයක් කරා පිය නැගීමට අවශ්‍ය අඩිතාලම දමනු ලබයි.

ඒ අනුව ධීවර කර්මාන්තය සඳහා රජයේ ඍජු මැදිහත් වීමක් දක්වා ඇති අතර ධීවර ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා ධීවර අමාත්‍යාංශය යටතේ ආයතන 06 ක් ද ස්ථාපිත කොට ඇත. රජයේ ප්‍රතිපත්ති රාමුව තුල සිට නව ව්‍යාපෘති හා වැඩසටහන් මගින් ධීවර අමාත්‍යාංශය විශාල ඉදිරි සංවර්ධනයක් සපුරා ඇති අතර එය ජාතික ආර්ථිකයට විශාල දායකත්වයත් ලබා දීමට සමත් වී ඇත. අනන්‍ය ආර්ථික කලාපය සතු වර්ග කි.මී. 517000 ක් පමණ වන කරදිය ධීවර ක්ෂේත්‍රයේත්, හෙක්ටයාර් 489,000 පමණ වන කිවුල්දිය සහ මිරිදිය ධීවර ක්ෂේත්‍රවලත් පරිපාලනමය වගකීම ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සතුය.

මෙවන් පසුබිමක් තුල මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය ලෙස අප විසින් ශ්‍රී ලංකාවේ ධීවර ක්ෂේත්‍රය තුල පවතින රැකියා අවස්ථාවන් හඳුනා ගනිමින් හා සමීක්ෂණය තුලින් එකතු කරගන්නා ලද තොරතුරු ඇතුලත් කර ගනිමින් රැකියා පැතිකඩ පිළියෙල කිරීමට තීරණය කරන ලදි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා ඉහල දායකත්වයක් ලබා දීමේ ශක්‍යතාවයක් සහිත එමෙන්ම නව රැකියා අවස්ථා බිහි කිරීමේ ඉහළ ප්‍රවණතාවයක් සහිත බවට හඳුනාගෙන ඇති ධීවර ක්ෂේත්‍රයේ රැකියා පිළිබඳ සමීක්ෂණයක් සිදුකරන ලදි. ධීවර ක්ෂේත්‍රයේ ආයතන 10ක් මේ සඳහා උපයොගී කරගත් අතර ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මගින් තොරතුරු රැස් කරගන්නා ලදි. මෙහිදී මූලික අවධානය යොමු වූයේ ශ්‍රී ලංකා ධීවර ක්ෂේත්‍රය තුල වැඩි ඉල්ලුමක් ඇති රැකියා අවස්ථාවන් පිළිබඳවත් ඒ ඒ රැකියා සඳහා අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ කුසලතා පිළිබඳවත්, එම රැකියා අවස්ථාවන්හි සේවා තත්ත්වයන්, වැටුප් ඇතුළු ප්‍රතිලාභ සහ වෘත්තීය සංවර්ධන දිශානතීන් පිළිබඳවත් අධ්‍යනය කිරීමයි.ඒ සඳහා තෝරා ගනු ලැබූ ආයතන පහත පරිදි වේ.

- ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේනතුව (DFAR)
- ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිත ආයතනය (NARA)
- ජාතික ජලජීවී වගා සංවර්ධණ අධිකාරිය (NAQDA)
- ලංකා ධීවර සංස්ථාව (CFC)
- ලංකා වරාය නීතිගත සංස්ථාව (CFHC)
- සීමාසහිත සී _ නෝර් පදනම (Cey - Nor)
- ස්කයිවේ සී ෆුඩ්ස් ස්පෙෂලිටිස් පුද්ගලික සමාගම
- ජේ.පී.ෆ්‍රෙෂ් ප්‍රඩක්ස්
- ජේ.සී.ෆුඩ්ස් ප්‍රොසෙසින් පුද්ගලික සමාගම
- ට්‍රොපික් ෆ්‍රෝෂන් ෆුඩ්ස් ලිමිටඩ්

## 04. රාජ්‍ය සේවයේ රැකියා පැතිකඩ

මුළු සේවා නියුක්තියෙන් රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය15.1% වන අතර ඒ අතරින් උගත් තරුණ කණ්ඩායම් අතර රාජ්‍ය අංශයේ රැකියා සඳහා වැඩි නැඹුරුවක් පවතී.රාජ්‍ය අංශයේ රැකියා සඳහා ප්‍රවිශ්ට වීමේ දී අවශ්‍ය වන්නා වූ මූලික අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ අවබෝධයක් ලබා දීමත් අනවශ්‍ය ආකාරයට රාජ්‍ය අංශයේ රැකියා පෝලිමට එකතු වීම වළක්වනු පිණිසත් රාජ්‍ය අංශයේ රැකියා පැතිකඩ පිළිබඳ සමීක්ෂණය සිදු කෙරිණි.

මෙම සමීක්ෂණයේ මූලික අරමුණු වන්නේ රාජ්‍ය අංශයේ පවතින්නා වූ රැකියා කාණ්ඩ හඳුනා ගැනීම, රාජ්‍ය අංශයේ එක් එක් රැකියා සඳහා අවශ්‍ය වන්නා වූ සුදුසුකම් හා කුසලතාවයන් හඳුනා ගැනිම හා එම රැකියාවන්ගේ වෘත්තීය ගමන්මඟ හඳුනා ගැනීම.

මෙම සමීක්ෂණය සඳහා පහත සඳහන් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ තෝරා ගන්නා අතර සකසන ලද ප්‍රශ්නාවලියක් හරහා දත්ත රැස් කරන ලදී.

- රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ අමාත්‍යාංශය
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- කෘෂිකර්ම අමාත්‍යාංශය
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

මේ යටතේ තනතුරු 73 ක් ආවරණය කළ අතර රාජ්‍ය අංශයේ දීප ව්‍යාප්ත සේවාවන්, සංයුක්ත සේවාවන්,වෙනත් සේවාවන් හා දෙපාර්තමේන්තු සේවාවන් ඒ අතර වේ.

## 05. ශ්‍රම වෙළඳපොළ තොරතුරු පුරෝකථනය

රටක සමාජ ආර්ථික සංවර්ධනය සඳහා ඉතා වැදගත් අංශයක් ලෙස ශ්‍රම වෙළඳ පොළ කටයුතු කරයි. කෘෂි කාර්මික, කාර්මික හා සේවා යන අංශයන්හි නිෂ්පාදන කාර්යාවලි සඳහා මානව ශ්‍රමය අත්‍යාවශ්‍ය සාධකයක් වේ. එමෙන්ම, ශ්‍රමය වෙනුවෙන් ලබන පාරිශ්‍රමික (එනම් වැටුප්, වේතන හා ලාභාංශ) කුටුම්භයන්හි ආදයම් උත්පාදන මාර්ග වශයෙන් ඉතා වැදගත් වේ. එබැවින් ශ්‍රම වෙළඳ පොළ තොරතුරු රටක ආර්ථික වෘද්ධිය මැනීම සඳහා මෙන්ම ඉදිරි සැලසුම් සම්පාදනය සඳහා ද ඉතා වැදගත්කමක් උසුලන අංශයකි.

තවද, ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක් රැස්කර විශ්ලේෂණය කිරීම තුළින් ජාතික හා කලාපීය වශයෙන් මානව සම්පත් උපයෝජනය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ සඳහා උපකාරී වීම ද අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකාවේ ශ්‍රම ඉල්ලුම පිළබඳව ජාතික වශයෙන් සමීක්ෂණයක් 2017 වර්ෂය තුළ ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලද මුත්, මෙතෙක් එම සමීක්ෂණයෙහි

තොරතුරු ප්‍රකාශයට පත් කොට නොමැත. ඒ අනුව, මීට පෙර වර්ෂයන්හි දී අනුගමනය කළ පරිදි, එවැනි ශ්‍රම ඉල්ලුම පිළිබඳ තොරතුරු සඳහා පැවැති ආසන්නතම විශ්වාසනීය මූලාශ්‍රයක් වශයෙන් "තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව" මඟින් සිදු කරන ලද වාර්ෂික ඇබෑර්තු විශ්ලේෂණ දත්ත මෙම වාර්තාව සඳහා උපයෝගී කර ගෙන ඇත.

මෙහි දී විශේෂයෙන් ම රැකියා අපේක්ෂිතයන් බලාපොරොත්තු වන ශ්‍රම වෙළඳපොළ තොරතුරු අතර ඉහල ඉල්ලුමක් ඇති වෘත්තීය ක්ෂේත්‍ර, රැකියා අවස්ථා ආදිය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. එසේම එවැනි රැකියා අවස්ථා සඳහා අත්‍යාවශ්‍ය වන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද යන්න ද ඒ සඳහා සලකා බලනු ලබන පළපුරුද්ද යනාදිය පිළිබඳ තොරතුරු කෙරෙහිද ඔවුන්ගේ ප්‍රමුඛතාව ලැබේ. මෙවැනි තොරතුරු පදනම් කරගෙන ශ්‍රම ඉල්ලුමට සරිලන පරිදි තම සුදුසුකම් සපුරා ගැනීම තුළින් වඩා පහසුවෙන් රැකියා අපේක්ෂා මුදුන්පමුණුවා ගැනීමට රැකියා සොයන්නන්ට හැකියාව ලැබේ.

මෙම වාර්තාවේ දි විශේෂයෙන් ම තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ලබා ගන්නා ලද වසර හතක (2008 – 2014) ශ්‍රම වෙළඳපොළ දත්ත විශ්ලෙෂණය (SPSS ක්‍රමවේදය) කර ලබා ගත් තොරතුරු ඇතුළත් කොට විධිමත් හා අවිධිමත් අංශවල පවතින ප්‍රධාන වෘත්තීය කාණ්ඩ, ප්‍රධාන වෘත්තීය අංශ, අධ්‍යාපන සුදුසුකම්, ස්ත්‍රී/ පුරුෂභාවය අනුව ශ්‍රම ඉල්ලුම, පළපුරුද්ද ආදියෙහි ඉල්ලුමෙහි පැතිරීම පිළිබඳව සංක්ෂිප්තව දක්වා ඇත.

## 06. ස්වයං රැකියා විභවතාවය පිළිබඳ සමීක්ෂණය

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය සහිතව මෙම ස්වයංරැකියා විභවතාවයන් පිළිබඳ සමීක්ෂණය සිදු කරන ලද අතර එමගින් හම්බන්තොට, පුත්තලම, යාපනය, මඩකලපුව යන දිස්ත්‍රික්කයන් හි 2016 වසර තුළ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දියත්කරන ලද "ජීවනෝපාය සංවර්ධන" හා "පරිසර හිතකාමී ආදර්ශ ගම්මාන" යනාදී සමෘද්ධි වැඩසටහන්වල ප්‍රතිලාභීන් වෙත අදාළ වැඩසටහන් හරහා ලද සෘජු ප්‍රතිලාභයන් වශයෙන් ස්වයං රැකියා අවස්ථා ජනිත වීම පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ පනරාල්වරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයන්ගේ අනුග්‍රහය සහිතව සැලසුම් කරන ලද මෙම සමීක්ෂණයේ දී, දත්ත රැස්කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ ක්‍රියාකාරී සහය ද ලැබුනු බැවින් සමීක්ෂණයට තොරාගන්නා ලද නියැදියට අයත් වූ ප්‍රතිලාභීන් වෙතින් ඉහල ප්‍රතිචාරයක් ලබා ගැනීමට හැකි වී ඇත.

හම්බන්තොට, පුත්තලම, යාපනය, මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සහනාධාරලාභීන් අතුරින් අහඹු නියැදි ක්‍රමවේදය යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් සමූහයක් මෙම සමීක්ෂණය සඳහා උපයෝගි කරගන්නා ලදී. විධිමත් ප්‍රශ්නාවලියක් මගින් අදාල සමෘද්ධි සහනාධාරලාභීන් වෙතින් තොරතුරු රැස්කිරීම සිදුකෙරිනි. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවහි මානව සම්පත් සංවර්ධන නිලධාරින් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සහය ලැබුනු බැවින් දත්ත රැස් කිරීම පහසු කාර්යයක් විය.

## 07. සමාජ ආර්ථික දත්ත අත්පොත

වර්තමාන ශ්‍රී ලංකාව තුල දැනට පවතින තරඟකාරී අධ්‍යාපනය හේතුකොට ගෙන විශ්වීය දැනුම වඩාත් පුළුල් ලෙස සොයා යාමට නව මාවතක් විවර කර ඇති බැවින් කුඩා අවධියේ සිටම දරුවන් දැනුමින් පරිපූර්ණ පුද්ගලයන් කිරීම අප සැමගේ වගකීමයි. පාසල් අධ්‍යාපනයේ කඩඉම් ජය ගැනීමටත්, ඉන් අනතුරුව උසස් අධ්‍යාපනය කරා යාමට වෙර දරන දරුවන්ට අත්වැලක් වීමටත් ඊහා සමගාමීව දේශීය හා විදේශීය සමාජීය ආර්ථික ප්‍රවණතා විශේෂයෙන්ම ශ්‍රම වෙළඳපොළ පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමටත්, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මිනිස්බල සැලසුම් සංවර්ධන

හා පර්යේෂණ අංශය මඟින් සමාජ ආර්ථික දත්ත අත්පොත ප්‍රකාශයට පත්කරනු ලැබේ.
දෙස් විදෙස් පිළිගත් සංවිධාන සහ ආයතන මඟින් ප්‍රකාශයට පත්කර ඇති සමාජ , ආර්ථික වටිනාකමක් සහිත දත්ත එක්රැස් කර අත්පොතක් ලෙස එළිදැක්වීම තුළින් ඔබට මූලාශ්‍ර පරිශීලනයෙන් තොරව දත්ත සපයා ගැනීමේ පහසුව සලසා දීම අපගේ මූලික අරමුණයි.

රටක සමාජ ආර්ථික හා දේශපාලන මට්ටම තීරණය කිරීමෙහිලා ඉතා වැදගත් නිර්ණායකයන් වන්නේ ඒ ආශ්‍රිත දත්ත හා දර්ශකයන්ය. රටක සංවර්ධිත ඉලක්ක කරා ළඟා වන්නේ කෙසේද? යන්න පිළිබඳව මෙම දත්ත අත්පොත තුළින් අවබෝධයක් පරිශීලනය කරන්නන්ට ලබා ගැනීමට හැකිවනු ඇත.

දෙස් විදෙස් මූලාශ්‍ර භාවිතකර මෙම පොත නිර්මාණය කරන බැවින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය කරා ළඟා වීමට අවශ්‍ය සමාජ ආර්ථික තත්ත්ව මොනවාද යන්න පිළිබඳව විශ්ලේශනාත්මකව විමර්ශනයට ලක් කිරීමට හැකිවනු ඇත.

එමෙන්ම මෙම දත්ත අත්පොත උසස්පෙළ හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තම විෂය ක්ෂේත්‍රවලට මෙන්ම ඔවුන්ගේ සාමාන්‍ය දැනුම, විෂය දැනුම වර්ධනය සඳහා ද මහෝපකාරී වනු ඇත.

**5.2 ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

**2017 වර්ෂයේ ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය හා සම්බන්ධව කරන ලද ප්‍රගතිය.**

- **ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය වර්තමාන රජයේ මධ්‍යකාලීන සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුකූලව නැවත සංශෝධනය කරන ලදී.**
- **එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ඍජුවම අදාල වන බවට හඳුනා ගෙන ඇති අමාත්‍යාංශ 25ක් වෙතින්, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරි සැලැස්ම 2017-2020 කාලසීමාවට අදාල වන පරිදි සංශෝධනය කිරීමට යෝජනා කැඳවන ලදී.**
- **අමාත්‍යාංශ 17කින් සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරී සැලැස්ම ලබා දී ඇති අතර අනෙකුත් අමාත්‍යාංශ 8 ක් වෙතින් ලබා දී ඇති ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරන කටයුතු සිදු කෙරෙමින් පවතී.**
- **ප්‍රතිපත්තිය සමඟ සම්බන්ධ වී ඇති අමාත්‍යාංශ වලින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ කටයුතු ද මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකය මගින් සිදු කරනු ලබයි.**

## දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද විශේෂ වැඩසටහන්-

1. ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රම පාදක කොට ගත් මල් වගා ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ නියමු ව්‍යාපෘතිය- සුනිසි මෙහෙවර වැඩසටහනකි.

   මෙම ව්‍යාපෘතිය යටතේ රැකියා විරහිත උපාධිධාරින් මල් වගා ක්ෂේත්‍රයට අදාල විවිධ ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීම,ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රම මගින් නිපදවන රෝපණ ද්‍රව්‍ය වගා තවාන් හිමි ව්‍යවසායකයින් බිහි කිරීම හා සංවර්ධනය, ක්ෂුද්‍ර/ පටක රෝපණ ක්‍රම භාවිතා කර මුලික රෝපණ ද්‍රව්‍ය නිපදවන ව්‍යාපාරික මට්ටමේ විද්‍යාගාරයක් ස්ථාපිත කර ඒ මගින් ඍජුව හා වක්‍රව රැකියා නිර්මාණය හා ව්‍යවසායකයින් සංවර්ධනය අපේක්ෂා කරනු ලබයි.

   මෙම පුහුණු වැඩසටහන් මාලාවේ උපාධිධාරී සහ උපාධි අපේක්ෂිතයන් සඳහා වු වැඩසටහන අගෝස්තු මස 4 -9 දිනවල පවත්වා ඇති අතර එයට අමතරව ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් වෙනුවෙන් වැඩසටහන් 3ක් පවත්වන ලදි.

2. බදුල්ල දිස්ත්‍රික්කයේ ආබාධිත තැනැත්තන් සිටින පවුල්වල ගෘහණියන් හා දිස්ත්‍රික්කයේ තනි මාපිය පවුල්වල කාන්තාවන් ආර්ථික හා සාමාජීය වශයෙන් බලගැන්වීම හා ඔවුන් ආර්ථිකයේ කොටස්කරුවන් කරවීම සඳහා වන ව්‍යාපෘති යෝජනාව.- සුනිසි මෙහෙවර වැඩසටහනකි.
   මෙම වැඩසටහන 2017 නොවැම්බර් සහ දෙසැම්බර් මාසයේදී පවත්වන ලදි.

3. SIYB පුහුණු කරුවන් පුහුණු කිරීමේ වැඩසටහන
   දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ ධාරිතා වර්ධනය සඳහා මෙම පුහුණුව පවත්වන ලදි.

4.කොරියානු රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම මත සේවානියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන.

5. වෘත්තීය කාර්ය සාධනය වැඩිදියුණු කිරීම / පුහුණු සඳහා යොමු කිරීම් යටතේ පුද්ගලයන් 15,100 කට සේවා සපයා ඇති අතර වෘත්තීය මාර්ගෝපදේශ සැපයීම් යටතේ පුද්ගලයන් 39,370ක් සඳහා දීප ව්‍යාප්තව වෘත්තීය මාර්ගෝපදේශන සේවා සපයා ඇත.

6. අවධානමට ලක්වූවන් සඳහා දීප ව්‍යාප්තව වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් 2020ක් පවත්වා ඇත.

7.රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන - ILO fund under EU-SDDP Project

| දිස්ත්‍රික්කය | වැඩසටහන් ගණන | සහභාගි වූ රැකියා අපේක්ෂිතයන් සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|
| මඩකලපුව | 12 | 645 | 117,960 |
| යාපනය | 12 | 690 | 119,976 |
| කිලිනොච්චි | 2 | 94 | 19,971 |
| මන්නාරම | 2 | 106 | 17,780 |
| වවුනියාව | 2 | 100 | 20,000 |
| ත්‍රිකුණාමලය | 8 | 381 | 73,690 |
| මුලතිව් | 1 | 51 | 8,995 |
| අම්පාර | 11 | 542 | 117,000 |
| එකතුව | 50 | 2609 | 495,372 |

දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පුහුණු වැඩසටහන්හි ලබා ගන්නා ලද ඡායාරූප

මල් වගා ව්‍යවසායකයින් පුහුණු කිරීමේ විශේෂ ව්‍යාපෘතිය

2017/11/18,2017/11/19,2017/11/20,2017/11/21,2017/11








බදුල්ල දිස්ත්‍රික්කයේ පාවහන් නිශ්පාදන වැඩසටහන








දෙමාපියන් දැනුවත් කිරීම වැඩසටහන - 2017.02.13

මලියදේව පිරිමි විද්‍යාලය




උපාධිධාරි වැඩසටහන -

2017.07.25/2017.07.26/2017.07.27




උපාධිධාරි වැඩසටහන - 2017.12.07/2017.12.08

සබරගමුව විශ්ව විද්‍යාලය

# මිනිස්බල හා රැකීරක්‍ෂා දෙපාර්තමේන්තුව
# மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்
# Department of Manpower & Employment

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. වර්තමානයේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

2010 பெப்ரவரி 12 ஆம் திகதி 1640/31 ஆம் இலக்க அதி விசேட வர்தமானி அறிக்கை மூலம் மனித வலு மற்றும் வேலை வாய்ப்புத் திணைக்களம் 2010 ஆம் ஆண்டில் தொழில் தொடர்வுகள் மற்றும் மனிதவலு அமைச்சின் கீழ் ஸ்தாபிக்கப்பட்டது. தற்போது தொழிலாளர் மற்றும் தொழில் சங்கம் உறவுகள் அமைச்சின் கீழ் இயங்குகின்ற திணைக்களத்திடம் அரச தொழில் சேவைகள் நடாத்திப் போகுதல் மற்றும் தேசிய மனித வளங்கள் மற்றும் தொழில்கொள்கைகளின் ஏற்பாடுகள் செயற்படுத்தும் பொறுப்பும் வழங்கப்பட்டுள்ளது.

Department of Manpower and Employment was established with effected from 1st January 2010 under the Ministry of Labour Relations and Manpower, in terms of the special Gazette Extraordinary no 1640/30 on 12th February 2010 and conveyed the responsibilities to implement the provisions of National human resource & job policies and conducting State job servicers to the Department which is operating under the Ministry of Labour and Union affairs in present.


**Department of Manpower & Employment,**
9th Floor, Sethsirirpaya (Second Phase),
Battaramulla.